Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ගණිතය

සතිය- 3

ශ්‍රේණිය-10

සැකැස්ම -G.U.D.කුමාර
කෑ/දෙහි/ ගෝනගල ම. වි.

## 26 පාඩම - සංඛ්‍යාත ව්‍යාප්ති

- සමූහිත දත්තවල මධ්‍යන්‍යය සෙවීම

- සන්තතික දත්ත
  කාලය දිග බර වැනි මිණුම් වලින් ලබාගන්නා දත්ත **සන්තතික දත්ත** වේ  මෙම දත්ත වල අනුයාත පූර්ණ සංඛ්‍යා දෙකක් අතර තවත් අගයන් ඇත.
- විවික්ත දත්ත
  සන්තතික නොවන දත්ත **විවික්ත දත්ත** වේ . ඒවා පූර්ණ සංඛ්‍යාත්මක අගයන් ගනී

### සමූහිත සංඛ්‍යාත ව්‍යාප්ති

**පංති ප්‍රාන්තරයක මධ්‍ය අගය**

පංති ප්‍රාන්තරයක පහළ අගය හා ඉහළ අගය එකතුකර 2න් බෙදූ විට එම පංති ප්‍රාන්තරයේ මධ්‍ය අගය ලබාගත හැක

$\frac{0+8}{2} = 4$          මෙලෙස වගුවේ මධ්‍ය අගය තීරුව සම්පූර්ණ කරන්න

| පංති ප්‍රාන්තරය | මධ්‍ය අගය | සංඛ්‍යාතය |
|---|---|---|
| 00 - 08 | 4 | 09 |
| 09 - 17 | | 12 |
| 18 - 26 | | 10 |
| 27 - 35 | | 19 |
| 36 - 44 | | 11 |
| 45 - 53 | | 26 |
| 54 - 62 | | 13 |

- 9 - 17 පංති ප්‍රාන්තරයේ තරම 9 කි
- මෙම සංඛ්‍යා ව්‍යාප්තියේ පරාසය 62 - 00 = 62
- මෙහි මාත පංතිය 45 - 53
- ගණිතය පෙළ පොතේ 89,90 පිටු වල  **26.1 අභ්‍යාසයේ සියළු ගැටලු විසඳමු**

**සමූහිත දත්තවල මධ්‍යන්‍යය ගණනය කිරීම**

| පංති ප්‍රාන්තරය | මධ්‍ය අගය$(x)$ | සංඛ්‍යාතය$(f)$ | $(f \times x)$ |
|---|---|---|---|
| **00 - 10** | **5** | **3** | **15** |
| **10 - 20** | **15** | **5** | **75** |
| **20 - 30** | **25** | **7** | **175** |
| **30 - 40** | **35** | **4** | **140** |
| **40 - 50** | **45** | **1** | **45** |
| | | $\Sigma f = 20$ | $\Sigma fx = 450$ |

මධ්‍යන්‍යය $= \frac{\Sigma fx}{\Sigma f}$

$\frac{450}{20} = 22.5$

- ගණිතය පෙළ පොතේ 92,93 පිටු වල  **26.2 අභ්‍යාසයේ සියළු ගැටලු විසඳමු**